# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2046/53 - 2017 නොවැම්බර් මස 23 වැනි බ්‍රහස්පතින්ද - 2017.11.23**

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : 8/3/5/3/5.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : 4/3/9/2013/WS/425.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම් කොටස්වල විස්තර:*

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්පහසිය පත්තුව සුළු කොට්ඨාසයේ, රජ්ජම්මන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද අංක 25 දරන අවසාන ගම් පිඹුරේ කැබලි අංක 352 වශයෙන් දැක්වෙන පහත සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1700 ක් වූ ඉඩම් කොටස සඳහා මායිම්;

01. **කැබලි අංක 352**
ඉඩමේ නම: රජ්ජම්මන වතුයාය; මුල් හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.1700.

*උතුරට* : කැබලි අංක 353; *නැගෙනහිරට* : කැබලි අංක 353; *දකුණට* : කැබලි අංක 353; *බටහිරට* : 353.

ඉහත සඳහන් ඉඩම් සඳහා හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 දෙසැම්බර් මස 20 වැනි දින පෙ.ව. 9.30 ට මාතලේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2017 දෙසැම්බර් මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණ දිනයේදී ඉදිරිපත් කළ යුතුය.

කේ. පී. කේ. එල්. පී. මධුවන්ති,
ප්‍රාදේශීය ලේකම්,
මාතලේ.

2017 නොවැම්බර් මස 20 වැනි දින,
මාතලේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

12 - 200